**ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 299 - ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජනවාරි 24 දින ජාතික බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනය රු.මිලියන 25.87 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 25.28 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් රු. මිලියන 0.59 ක් හෙවත් සියයට 2.28 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට අදාළ විෂය අංක 29901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.69 | 2.67 | 1.00 | 2.04 | 10.00 | 6.18 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

කාර්යාලය යටතේ වන 2015 දෙසැම්බර් 31 දිනට පැවති පොදු තැන්පත් ගිණුම් 02 ක පැවැති ශේෂයන් පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0015/0154/000 | (2,825) |
| 6000/0000/00/0018/0050/000 | 2,825 |

## 2.4 විගණන නිරීක්ෂණය

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---

විෂය අංක 29901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු වර්ෂ 6 කට වැඩි කාලයක සිට පැවැත එන ශේෂවල එකතුව රු.139,410 ක් වී තිබුණත්, එම ශේෂ අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

### 3.2 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

---

#### 3.2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

#### 3.2.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

#### 3.2.3 අභ්‍යන්තර විගණනය

---

කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

#### 3.2.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.3 අනුකූල නොවීම්

---

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| XV වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය | පරිවාස කාලයේ සිටින නිලධාරින් 14 දෙනෙකු ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කර තිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 1646 | කාර්යාලය සතු සංචිත වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා එළඹෙන මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3.4 කාර්යසාධනය

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

කාර්යාලයේ අරමුණුවලට පරිබාහිර කටයුතු සඳහා පුවත්පත් දැන්වීමක් පල කිරිම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.271,320 ක් වැය කර තිබුණි. අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය මත මෙම ගෙවීම සිදු කළ බව අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුම් දී තිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

කාර්යාලය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලැසුම් ලියාපදිංචි කිරීම පිළිබඳ කාර්යසාධනයට අදාළ තොරතුරු පහත පරිදි විය.

| | වෙළඳ ලකුණු ලියාපදිංචිය | | පේටන්ට් බලපත්‍ර ලියාපදිංචිය | | කාර්මික සැලසුම් ලියාපදිංචිය | |
|---|---|---|---|---|---|---|
| | **2015** | **2014** | **2015** | **2014** | **2015** | **2014** |
| වර්ෂය තුළ ලැබුණු අයදුම්පත් ප්‍රමාණය | 9,415 | 8,552 | 481 | 536 | 457 | 529 |
| පරික්ෂණ වාර්තා සැකසීම කළ අයදුම්පත් ප්‍රමාණය | 12,623 | 21,931 | 439 | 313 | 443 | 349 |
| ගැසට් නිවේදනය පළ කල ප්‍රමාණය | 5,088 | 2,184 | 41 | 41 | 351 | 200 |
| ලියාපදිංචි කල ප්‍රමාණය | 2,272 | 1,140 | 262 | 263 | 246 | 529 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලැසුම්, ලියාපදිංචිය කිරීම ජාතික බුද්ධිමය දේපල කාර්යාලයේ ප්‍රධාන කාර්යය වුවද, වර්ෂයේදී ගැසට් කරන ලද හා ලියාපදිංචි කරන ලද ප්‍රමාණය, වර්ෂය තුළ ලද අයදුම්පත්වලට සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. කෙසේ වුවත්, සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු අයදුම්පත්වල කටයුතුවලට අමතරව ඉකුත් වර්ෂවල නිම නොකළ අයදුම්පත්වල කටයුතුද ඉටු කර තිබුණි.

- වෙළඳ ලකුණු සම්බන්ධයෙන් පරික්ෂණ කටයුතු පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 42 කින් අඩු වී තිබුණි. වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමට සැලකිය යුතු කාල ප්‍රමාදයක් සිදු වී තිබූ අතර 2015 වර්ෂයේදී ලියාපදිංචි කළ ප්‍රමාණය තුළ 2007 වර්ෂයේ සිට ලැබුණු අයදුම්පත්ද තිබුණි

- වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම්, ලියාපදිංචි කිරීම සඳහා පරික්ෂා කළ යුතුව පවතින අයදුම්පත් ප්‍රමාණය අධික වී තිබුණි. එම කටයුතු කඩිනම් කිරීම සඳහා 2013 වර්ෂයේ සිට පරික්ෂණ කටයුතු සඳහා කැලි පදනම මත ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.1,164,609 ක්

වැය කර තිබුණි. එසේ වුවත්, 2011 වර්ෂයේ සිට වාර්ෂිකව ගැසට් පත්‍රයේ පලකළ ප්‍රමාණයේ හා ලියාපදිංචි සහතික නිකුත් කළ ප්‍රමාණයන් සැසඳීමේදී සැලකිය යුතු වර්ධනයක් සිදු වී නොතිබුණි.

- වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලසුම් ලියාපදිංචි කිරිම සම්බන්ධයෙන් කාල පරිච්ඡේදයක් අවසන් වන විට ලියාපදිංචිය දක්වා වැඩ ආරම්භ කර ඇති අයදුම්පත් සංඛ්‍යාව කෙරීගෙන යන වැඩ ප්‍රමාණය ලෙස සැලැකිය හැකි වුවත්, ඒ අනුව තොරතුරු විධිමත් ක්‍රමවේදයක් අනුව පිළියෙල කර නොතිබුණි.

(ii) අරමුදලේ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරිම යටතේ පරිගණක ගත කරන ලද මුදල් අයකිරිමේ ක්‍රමය සහ අභ්‍යන්තර විද්‍යුත් මේල් ක්‍රමයක් හඳුන්වා දීම හා පද්ධති වැඩිදියුණු කිරිම යනාදි කටයුතු සිදු කිරිමට සැලසුම් කර තිබුණි. වර්ෂය තුළ ඒ සඳහා රු.3,969,434 ක් වැය කර පරිගණක මිලදී ගැනීම පමණක් සිදුකර තිබුණි.

(iii) තාක්ෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථාන ඇති කිරිම යටතේ පළාත් 09 ක ආවරණය වන පරිදි මධ්‍යස්ථාන 09 ක් පිහිටුවිමට සැලැසුම් කර තිබුණද, වර්ෂය තුළ මධ්‍යස්ථාන 06 ක් පමණක් පිහිටුවා තිබුණි.

**(ඇ) සැලැසුම් කිරිම**

**---------------**

**වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරිම**

**----------------------------------------------------------**

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරිමට සැලැසුම් කර තිබුණද, සුදුසු ඉඩමක් සොයා ගැනීමට නොහැකි වීම මත එම කාර්යය වර්ෂය තුළ සිදු කර නොතිබුණි.

**3.5 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

**-----------------------------------**

සමාලෝචිත වර්ෂයේදී ආයතනයට පරිබාහිර වෙනත් අමාත්‍යාංශ හා ආයතනවල නිලධාරින් 12 දෙනෙකු විදේශ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී කරවා තිබුණු අතර ඔවුන් අතරින් නිලධාරීන් 06 දෙනෙකු වෙනුවෙන් අනියම් දීමනා ලෙස රු.206,389ක් වැය කර තිබුණි.

**3.6 අවිධිමත් ගනුදෙනු**

**------------------**

ආයතනය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරික්ෂණය වු එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3(අ) ප්‍රසම්පාදනය ප්‍රකාරව සපයන ලද භාණ්ඩ පිරිවිතරවලට සහ වෙනත් එකඟ වු නියමයන්ට අනුකූල බව අදාළ තාක්ෂණික ඇගයිම් කමිටුව හා ස්ථානභාර නිලධාරී විසින් සහතිකයක් නිකුත් කළ යුතු වුවත්, කාර්යාලය විසින් සිදු කරන ලද මිලදී ගැනීම්වලදී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 සැප්තැම්බර් 15 දින ලංසු කැඳවා එකක් රු.19,900 බැගින් වූ මුද්‍රණ යන්ත්‍ර 03 ක් රු.59,700කට මිලදී ගෙන තිබුණි. එම භාණ්ඩ කොන්ත්‍රාත්කරු විසින් ලංසු කැඳවූ දින සිට මාස 03 ක පමණ ප්‍රමාදයකින් පසුව 2015 දෙසැම්බර් 11 දින කාර්යාලය වෙත සපයා තිබුණි.

**3.7 කළමනාකරණය දුර්වලතා**

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) කාර්යාලය විසින් බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමි භාගයක් රු.22,298,751ක් වැය කර ලබා ගෙන තිබුණි. පසුව අදාළ ඉඩම, නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගෙන තිබුණි. 2015 අප්‍රේල් 23 දින අමාත්‍ය මණ්ඩලය විසින් මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා වැය කළ මුදල ආපසු අයකර ගැනීම අනුමත කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානවන විටත් එම මුදල අයකර ගෙන නොතිබුණි.

(ආ) ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය උපයන ආදායමින් 1/3 ක කොටසක් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ප්‍රේෂණය කර තිබුණි. එම ආදායම ගිණුම්ගත කිරීම සඳහා අදායම් සංකේතයක් ලබා ගැනීමට කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. 2015 වර්ෂයේදී රු.30,679,973 ක් එසේ ප්‍රේෂණය කර තිබුණි.

(ඇ) ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වත්කම් සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛන එකිනෙක අංශ සඳහා වෙන වෙනම පවත්වා නොතිබුණු අතර ගබඩාවේ ඇති බඩු වට්ටෝරු පොතේ පමණක් සියළු වත්කම් සටහන් කර තිබුණි. එසේම එම භාණ්ඩ නිකුත් කිරීම් සටහන් කර නොතිබුණි. එය වත්කම්වල භාරය, ආරක්ෂාව හා පැවැත්ම සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපා තිබුණි. 2008 වර්ෂයේදී අවස්ථානගත වී තිබුණු ලැප්ටොප් පරිගණකයක් 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී ඌනතාවයක් ලෙස සඳහන් කර තිබුණි. ඒ සම්බන්ධ කරන ලද මූලික විමර්ශනයේදී, චෝදනා පත්‍රයක් ගොනු කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි නොවන බව සඳහන් කර තිබුණු අතර, වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි

**3.8 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 05 | 07 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 73 | 39 | 34 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 15 | 11 | 04 |
| | **එකතුව** | **104** | **59** | **45** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හා කාර්මික සැලැසුම්, ලියාපදිංචි කිරීම කාර්යාලයේ කාර්යයක් වී තිබුණත්, එම කාර්යයන් ඉටු කිරීමට අනුමත කාර්ය මණ්ඩලය පුරප්පාඩු වීම නිසා ඒ සඳහා 2013 මැයි 01 දින සිට කැලි ක්‍රමය මත ගෙවීම් කර කාර්යයන් ඉටු කර තිබුණි.